(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 50.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 නොවැම්බර් මස 24 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0259/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී සිසුන්ගේ පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළ පොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0475/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවසන් වරට පළාත් පාලන මැතිවරණ පවත්වන ලද දිනය කවරේද;

(ii) එක්සත් ජාතික පක්ෂය විසින් සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ජයග්‍රහණය කරන ලද පළාත් පාලන සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල කාලය නිමවීමට පෙර අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ විසුරුවා හරින ලද සභා කවරේද;

(v) ඒවා අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද දිනයන් සහ එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් සභා අතරින් නගරාධිපතිවරුන් ධුරයෙන් ඉවත් කරන ලද, ඔවුන්ගේ තනතුරු අත්හිටුවන ලද හෝ ඔවුන් තනතුරෙන් පහ කරන ලද, එසේත් නැති නම්, ඔවුන් විමර්ශනයට භාජනය කරන ලද පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(ii) එම සිදුවීම්වලට අදාළ දිනයන් සහ එබඳු ක්‍රියාමාර්ග ගැනීමට හේතු කවරේද;

(iii) මේ වන විට ඔවුන් සම්බන්ධයෙන් එළඹී ඇති නිගමනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0540/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - තිරික්කොණ්ඩුයාඩුමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0572/'10

4.

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 06/2006(iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විද්‍යුත් වෛද්‍ය කාර්මික විද්‍යාඥ හා වැඩ මුලික (විශේෂ) යන තනතුරු සඳහා කේත අංක MN - 7 - 2006 A ට අදාල වැටුප ගෙවන ලෙස අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් අංක BES/පුලි/විවිධ 99 1 හා 2009.08.25 දිනැති ලිපියෙන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වෙත දන්වා ඇතත් එම රෝහලේ ඉහත කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන්නේ කේත අංක MT2-2006 A දරන අඩු වැටුප් තලය බවත්;

(ii) එම කාර්ය මණ්ඩලයට වඩා අඩු වැටුප් තලයක සිටි සිවිල් (විදුලි, ගොඩනැගිලි) වැඩ මූලික (Forman) තනතුරු සඳහා කේත අංක MN - 7 - 2006 A වැටුප ගෙවන බැවින් වැටුප් විෂමතාවයක් ඇති වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත රෝහලේ ඇති සියලුම වෛද්‍ය උපකරණ (Medical Equipments) හා විකිරණ යන්ත්‍ර (X Ray Machine) නඩත්තුව වැනි අත්‍යවශ්‍ය සේවාවන් ඉටුකරනු ලබන මෙම විද්‍යුත් වෛද්‍ය කාර්මික විද්‍යාඥ කාර්ය මණ්ඩලය නිර්දේශිත වැටුප් තලයේ පිහිටුවා ඔවුන්ට හිමි හිඟ වැටුප් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0625/'10

5.

ගරු අශෝක් අබේසිංහ මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) නව නිර්මාණකරුවන් විසින් තමන්ට සිදුවන අසාධාරණකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නව නිමැයුම්කරුවන්ගේ කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති පැමිණිලි පිළිබඳව එතුමිය දන්නෙහිද?

(ආ) (i) නව නිර්මාණකරුවන් වන ව්‍යාපාරික සෙනෙවිරත්න, කථිකාචාර්ය රිචඩ් නිකපිටිය සහ කේ. ඩී. පෙරේරා යන අය විසින් ඔවුන්ගේ නිර්මාණ වංචාකර ඇති බවට කරනු ලබන ප්‍රකාශ සම්බන්ධව ගෙන ඇති පියවර කවරේද;

(ii) නව නිර්මාණකරුවන් විසින් නව නිමැවුම්කරුවන්ගේ කොමිසමේ සභාපති සහ එහි සමහර නිලධාරීන් සම්බන්ධව කර ඇති ලිඛිත පැමිණිලි පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර තිබේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිමැවුම්කරුවන්ගේ කොමිසමේ සභාපතිගේ අත්තනෝමතික ක්‍රියාවන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස නිර්මාණ මංකොල්ලයට හසුවී සිටින නිර්මාණකරුවෝ ජනාධිපතිතුමාගෙන් ලිඛිතව ඉල්ලා ඇති බවත්;

(ii) එම කොමිසමට වර්ෂයක් සඳහා රජය ලබාදුන් ප්‍රතිපාදන සුළු කාලයක් තුළ වියදම් කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ඈ) ඉහත සඳහන් කොමිසමේ විගණන වාර්තා එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0628/'10

6.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින කෘෂිකර්ම උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) කෘෂිකර්ම උපදේශක ශ්‍රේණි හා ඊට අදාළ ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් අනුව සිටිය යුතු කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(ii) ඌව පළාත් සභාවට බඳවාගත් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) කෘෂිකර්ම උපදේශක පුහුණු හා කෘෂිකර්ම ඩිප්ලෝමාවේදීන් අතර සමානත්වයක් පවතින්නේද;

(iv) කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණිය සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(v) කෘෂිකර්ම ඩිප්ලෝමාවේදීන්, කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0641/'10

7.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම්වල සේවය කරන රාජ්‍ය සහ පළාත් සභාවලට අයත් නිලධාරීන් කවරේද;

(ii) එම එක් එක් නිලධාරීයා ඉටු කරන රාජකාරිය සහ ගෙවනු ලබන ආරම්භක මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වාර්ෂිකව මෙම නිලධාරීන් සඳහා වේතන හා දීමනා ගෙවීම වෙනුවෙන් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රජය විසින් ග්‍රාම නිලධාරී වසම් සඳහා පත්කිරීමට බලාපොරොත්තුවන ජනසභා ලේකම්වරුන්ගේ කාර්යභාරයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/'10

8.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙම වර්ෂය තුළදී රැකියා ලබා දීමට අපේක්ෂිත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණ ද;

(ii) ඒ සඳහා දැන්වීම් ප්‍රසිද්ධකර සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

(iv) ඉහත රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0338/'10

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අග්බෝපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වීරවිල නව නගරය, අග්බෝපුර, කු.ග. 19, අංක 447 දරන නිවාස ඉඩම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 1998/01/27 දිනැති හම්/11/ප්‍ර 47494 දරන දීමනා පත්‍රය මඟින් එච්. ජී. දයානන්ද මහතා වෙත ලබාදී ඇති බවත්;

(ii) ඒ අනුව එම දීමනා පත්‍රයේ සඳහන් හතර මායිම් තුළ පිහිටි භූමි භාගය ඔහුට හිමි වන බවත්;

(iii) දයානන්ද මහතා මෙම ඉඩම වසර 21 ක් භුක්ති විඳ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩමට වෙනත් පුද්ගලයෙකු අනවසරයෙන් ඇතුළුකරලීමට එම ප්‍රදේශයේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් විසින් කටයුතු කර ඇති බව එතුමා පිළිගන්නේද ;

(ii) එසේ නම්, දයානන්ද මහතාට අයථා බලපෑම් කළ එම නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද:

(iii) එම ඉඩම් කොටස නිරවුල්කර දයානන්ද මහතාට ලබා දීම සඳහා අදාළ බලධාරීන්ට නියෝග කරන්නේද;

(iv) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0476/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 10ක කාලය තුළ එක් එක් වර්ෂයේදී සිගරට් සහ මධ්‍යසාරවල මිල වැඩි කරනු ලැබූ දිනයන් සහ ප්‍රමාණයන් කවරේද;

(ii) සිගරට් සහ මධ්‍යසාරවල මිල වැඩි කළ එම එක් එක් අවස්ථාවේදී පෙර පැවැති මිලට වඩා වැඩියෙන් නියම කළ මිල ගණන් හේතුවෙන් උපයාගත් සමස්ත ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිල වැඩි කිරීම මගින් සිගරට් හා මධ්‍යසාර භාවිතය අධෛර්යමත් කිරීමට රජය උනන්දුවක් දක්වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සිගරට් සහ මධ්‍යසාර සඳහා පනවා ඇති සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0541/'10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, අල්ල - කන්තලේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ අධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0629/'10

12.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වසා දැමූ එක් එක් පාසලක සිටි ගුරුවරු සංඛ්‍යාව හා සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකාවේ රජයේ පාසල්වලින් පරිගණක , අන්තර්ජාල , විදුලිය, පානීය ජලය, දුරකථන, පුස්තකාල, විද්‍යාගාර , ක්‍රීඩාංගන හා වැසිකිලි යන එක් එක් පහසුකම ඇති පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(ii) ඉහත එක් එක් පහසුකම ඇති පාසල් සංඛ්‍යාව මුළු රජයේ පාසල් සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0478/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මූල්‍ය වගකීම් පනතට අනුව රටේ මූල්‍ය තත්වය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත කවදාද;

(ii) මූල්‍ය වගකීම් පනතට අනුව ගිණුම් ප්‍රකාශනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එය ඉදිරිපත් කරනු ලැබුවේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගිණුම් ප්‍රකාශනයෙහි හෙජිං ගනුදෙනුව අවිනිශ්චිත වගකීමක් ලෙස සඳහන් කර තිබේද හා නොඑසේ නම් ඊට හේතුව කවරේද;

(ii) හෙජිං ගනුදෙනුව පිළිබඳ ප්‍රශ්නයෙහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) විනිමය පාලන දෙපාර්තමේන්තුව ගෙවීම් නොකරන ලෙසට උපදෙස් දී තිබූ නමුත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හෝ රජය විසින් හෙජිං ගනුදෙනුව වෙනුවෙන් ජාත්‍යන්තර බැංකු වෙත ගෙවීම් කරනු ලැබුවේද;

(iv) හෙජිං ගනුදෙනුවට අදාළ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගනු ලබන නිශ්චිත ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0494/'10

14\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ශ්‍රී ලංකාවේ ජීවත්වන අඳ ගොවියන්ගේ අඳ අයිතිය, ඉඩම් අයිතිය සහ අනුප්‍රාප්තික අයිතිය අහිමි වී ඇති බවත්;

(ii) ඊට ප්‍රධානතම හේතුව 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අඳ ගොවියාගේ අඳ අයිතිය නැවත වරක් නව පනතක් මගින් ඔවුන්ට ලබාදීමට කටයුතු කරන්න්නේද;

(ii) එසේ නම්, ඊට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලබන නිශ්චිත කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0546/'10

15\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ආරුගම්බේ පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු ජානක බණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"දාම්පේ,මීගොඩ බෝධිවර්ධනාරාම ශ්‍රී මධුරසාම පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (දෙවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2010 නොවැම්බර් 22) [1].

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

# 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ

නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*9.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල්

පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*12.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*13.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*14.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*15.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*16.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

17.

තාරුණ්‍යයට හෙටක් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

18.

රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

[1] ''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය'' යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.